# 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම පිළිබඳ එම පනතේ 10 වන වගන්තිය අනුව ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව

## 2023

## අමාත්‍ය මණ්ඩල කාර්යාලය

ලොයිඩ්ස් ගොඩනැගිල්ල, ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත, කොළඹ 01.

www.cabinetoffice.gov.lk

# පටුන


| | විස්තර | පිටුව |
|---|---|---|
| 1. | පොදු අධිකාරිය පිළිබඳ විස්තර | 1 |
| 2. | අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා එහි කාර්යභාරය | 1-2 |
| 3. | තොරතුරු නිලධාරි සහ නම්කළ නිලධාරි පිළිබඳ විස්තර | 2 |
| 4. | අනුකූලතා සමාලෝචනය | 2-3 |
| 5. | වර්ෂය තුළ ලැබුණු තොරතුරු ඉල්ලීම් වල සාරාංශය | 4 |
| 6. | තොරතුරු ඉල්ලීම්වල ස්වභාවය | 5 |
| 7. | තොරතුරු ඉල්ලා සිටින්නා පිළිබඳ පැතිකඩ | 6 |
| 8. | තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම හේතුවෙන් යම් පුද්ගලයෙකුට දඬුවම් පැනවීම හෝ විනය ක්‍රියාමාර්ග ගැනීම | 6 |
| 9. | අභියාචනා සහ කොමිෂන් සභාවේ මාර්ගොපදේශ | 7 |
| 10. | තොරතුරු කළමනාකරණය සහ වාර්තා පවත්වාගෙනයාම | 8-10 |
| 11. | වාර්තා පවත්වාගෙන යාම හා කළමනාකරණය වැඩිදියුණු කිරීම සහ ඒ සම්බන්ධයෙන් වන බාධක ඉවත් කිරීම සඳහා යෝජනා | 11 |
| 12. | තොරතුරු ලබාගැනීම සඳහා පුරවැසියන්ට ලබා දී ඇති පහසුකම් | 11 |
| 13. | තොරතුරු ලබාදීම සඳහා 2023 වර්ෂය තුළ අයකරන ලද ගාස්තු | 12 |
| 14. | තොරතුරු පනතේ ක්‍රියාකාරිත්වය හා විනිවිදභාවය ප්‍රවර්ධනය උදෙසා වන යෝජනා | 12-13 |

# 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීම සම්බන්ධයෙන් තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කරනු ලබන වාර්ෂික වාර්තාව - 2023

## 1. පොදු අධිකාරිය පිළිබඳ විස්තර

**1.1 නම** අමාත්‍ය මණ්ඩල කාර්යාලය

**1.2 ලිපිනය** ලොයිඩ්ස් ගොඩනැගිල්ල
ශ්‍රීමත් බාරොන් ජයතිලක මාවත
කොළඹ 01

**1.3 වෙබ් සබැඳිය** www.cabinetoffice.gov.lk

## 2. අමාත්‍ය මණ්ඩල කාර්යාලය හා එහි කාර්යභාරය

ජනරජයේ ආණ්ඩුවේ පාලනය, මෙහෙයවීම හා ඒ පාලනය පිළිබඳ විධානයට අදාළව අමාත්‍ය මණ්ඩලය වෙත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවෙන් පැවරී ඇති කර්තව්‍යයන් ඉටු කිරීම සඳහා අවශ්‍ය සහාය සේවාවන් සැපයීම පිණිස අමාත්‍ය මණ්ඩල කාර්යාලය ස්ථාපිත කරනු ලැබ ඇත. අතිගරු ජනාධිපතිතුමාගේ විධානයන්ට යටත්ව, අතිගරු ජනාධිපතිතුමා විසින් හෝ අමාත්‍ය මණ්ඩලය විසින් හෝ පවරනු ලබන්නා වූ කර්තව්‍යයන් සහ කාර්යය ඉටු කිරීම සඳහා අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයාට සහායවීම මෙම කාර්යාලයේ වගකීම වේ.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 51(2)(අ) ව්‍යවස්ථාව ප්‍රකාරව අතිගරු ජනාධිපතිතුමා විසින් පත්කරනු ලබන අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ප්‍රධානියා වශයෙන් කටයුතු කරනු ලබයි.

සතිපතා පැවැත්වෙන අමාත්‍ය මණ්ඩල රැස්වීම් හා අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම් සංවිධානය කිරීම; ප්‍රතිපත්ති සම්පාදනය හා ජනරජයේ පාලනය මෙහෙයවීමට අදාළව ඉදිරිපත්වන අමාත්‍ය මණ්ඩල සංදේශ සම්බන්ධයෙන් නිරවුල්ව හා නිසි අවබෝධයෙන් තීරණ ගැනීමට පහසු වන පරිදි, එම සංදේශවල නෛතික හා ප්‍රතිපත්තිමය පසුබිම ගැඹුරින් අධ්‍යයනය කර අමාත්‍ය මණ්ඩලයටත්, අමාත්‍ය මණ්ඩල අනුකාරක සභාවන්ටත් කරුණු ඉදිරිපත් කිරීම; අමාත්‍ය මණ්ඩල අනුකාරක සභා රැස්වීම්වලදී සහ අමාත්‍ය මණ්ඩල රැස්වීම්වලදී එළඹි තීරණ ඇතුළත් වාර්තා භාෂාත්‍රයෙන් සකස් කිරීම හා එකී

වාර්තා අමාත්‍යවරුන් වෙතත්, අදාළ අමාත්‍යාංශ ලේකම්වරුන් හා අදාළ වෙනත් බලධරයන් වෙතත් යොමු කිරීම; අමාත්‍ය මණ්ඩලය විසින් ගනු ලබන තීරණ මහජනතාව වෙත දැනුම් දීමේ මාධ්‍ය වර්තාව සකස් කිරීම සහ අමාත්‍ය මණ්ඩලය වගඋත්තරකරුවන් කරමින් අධිකරණයට ඉදිරිපත් වන නඩුකටයුතු සම්බන්ධයෙන් කටයුතු කිරීම අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉටු කරනු ලබන ප්‍රධාන කර්තව්‍යයන් අතර වේ.

## 3. 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා 2023 වර්ෂයේදී පත් කරනු ලැබ සිටි නිලධාරින් පිළිබඳ විස්තර:

| | |
|---|---|
| නම් කළ නිලධාරි: | **ඩබ්ලිව්.එම්.ඩී.ජේ. ප්‍රනාන්දු මහතා**<br>අමාත්‍ය මණ්ඩලයේ ලේකම්<br><br>දුරකතන අංකය :+94112329620<br>ෆැක්ස් : +94112323730<br>විද්‍යුත් තැපැල<br>: secretary@cabinetoffice.gov.lk |
| තොරතුරු නිලධාරි : | **ඩබ්ලිව්. කේ. වීරවර්ධන මහතා**<br>ජ්‍යෙෂ්ඨ සහකාර ලේකම්<br>දුරකතන අංකය : +94112431011<br>ෆැක්ස් : +94112323730<br>විද්‍යුත් තැපැල : info@cabinetoffice.gov.lk, rti@cabinetoffice.gov.lk |
| විෂය භාර කළමනාකරණ සේවා නිලධාරි: | ඩබ්ලිව්. ඩී. ඉෂාරි දිලංකා මෙනෙවිය<br>කළමනාකරණ සේවා නිලධාරි සේවය III |

## 4. අනුකූලතා සමාලෝචනය

තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ මහජනතාව විසින් ඉල්ලුම් කරනු ලබන අමාත්‍ය මණ්ඩල සංදේශ හා තීරණ ඇතුළු තොරතුරු ලබාදීම 2023 වර්ෂය තුළද කාර්යක්ෂමව සිදු කිරීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් කටයුතු යොදා තිබිණ.

කිසියම් අමාත්‍ය මණ්ඩල සංදේශයක් පාදක කර නොගෙන, එහෙත් 'වෙනත් කරුණු' යටතේ අමාත්‍ය මණ්ඩලය විසින් සාකච්ඡාවට ගන්නා ලද කරුණු සම්බන්ධයෙන් ගනු ලැබූ තීරණ සහ කාර්යාලය සතුව පවතින අමාත්‍ය මණ්ඩල තීරණ හා සම්බන්ධ නොවන අනෙකුත් තොරතුරු අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් එකී පනතේ විධිවිධාන වලට යටත්ව මහජනතාව වෙත සෘජුවම නිකුත් කරන ලදී.

අමාත්‍ය මණ්ඩල කාර්යාලය භාරයේ ඇති යම් අමාත්‍යාංශයක්/කාර්යාලයක් විසින් ඉදිරිපත් කරනු ලැබූ අමාත්‍ය මණ්ඩල සංදේශ/සටහන් හා ඒවාට අදාළ තොරතුරු 22/විවිධ(015) හා 2022-03-22 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය පරිදි, අදාළ අවස්ථාවන්හිදී පනතේ 29 වගන්තියේ විධිවිධාන අනුගමනය කිරීමෙන් අනතුරුව මහජනතාව වෙත නිකුත් කිරීමට කටයුතු කරන ලදී.

එමෙන්ම, මහජනතාව විසින් විවිධ අමාත්‍යාංශ හා මහජන ආයතන වෙතින් තොරතුරු ඉල්ලීම් මගින් ඉල්ලා සිටින පැරණි අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාළ ලේඛන එම ආයතන භාරයේ නොමැති අවස්ථාවන්හිදී මෙම කාර්යාලය වෙතින් ඉල්ලා සිටින අතර එවිට අදාළ තොරතුරු මහජනතාව වෙත නිකුත් කළ හැකි වන පරිදි එම මහජන ආයතන වෙත නිකුත් කිරීමද සිදු කරන ලදී.

**4.1** මහජනතාවගෙන් ලැබෙන තොරතුරු ඉල්ලීම් ලියාපදිංචි කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල කාර්යාලයෙහි වෙනම ලේඛනයක් පවත්වාගෙන යනු ලබන අතර, තොරතුරු ඉල්ලීම ලැබුණ දිනය, ඉල්ලුම්කරුගේ සම්බන්ධීකරණ විස්තර, ඒ ඒ තොරතුරු ඉල්ලීම සම්බන්ධයෙන් ගන්නා ලද තීරණය, තොරතුරු නිකුත් කරන ලද දිනය හා ඒ සඳහා අදාළ ගාස්තු අයකරන ලද්දේ නම් එම තොරතුරු යනාදිය ඇතුළත් කෙරේ. තවද එක් එක් තොරතුරු ඉල්ලීම සඳහා වෙන වෙනම ගොනු පවත්වා ගෙන යනු ලැබේ.

**4.2** ඉහත 4.1 හි සඳහන් ලේඛනයේ විද්‍යුත් පිටපතක්ද යාවත්කාලීන කරමින් පවත්වාගෙන යනු ලැබේ.

**4.3** අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ මාණ්ඩලික නිලධාරින්ගේ නම්, තනතුරු නාම හා සම්බන්ධීකරණ තොරතුරු මහජනතාවගේ දැන ගැනීම සඳහා කාර්යාලයේ නිල වෙබ් අඩවියේ පළ කරනු ලැබ තිබේ. තවද, අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් ඉටු කරනු ලබන කර්තව්‍යයන් පිළිබඳ තොරතුරුද මහජනතාවගේ දැන ගැනීම සඳහා එහි පළ කරනු ලැබ තිබේ.

තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන යටතේ තොරතුරු ඉල්ලීමක් පැමිණ භාර දීමෙන්, තැපැල් මගින් හෝ විද්‍යුත් තැපැල් ඔස්සේ අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත යොමු කිරීමට මහජනතාවට අවස්ථාව සලසා දී තිබේ. අදාළ ඉල්ලුම්පත් කාර්යාලයේ වෙබ් අඩවියෙන් බාගත කිරීම සඳහාද අවස්ථාව සලසා දී තිබේ. විද්‍යුත් තැපැල් මගින් ලැබෙන තොරතුරු ඉල්ලීම් සඳහා විද්‍යුත් තැපැල් මඟින්ම ප්‍රතිචාර දැක්වීමට කටයුතු කරනු ලැබේ.

## 5. වර්ෂය තුළ ලැබුණු තොරතුරු ඉල්ලීම්වල සාරාංශය

2023 වර්ෂය තුළ තොරතුරු ඉල්ලීම් අයදුම්පත්/ලිපි 167 ක්, අමාත්‍ය මණ්ඩල කාර්යාලය වෙත ඉදිරිපත් වී ඇති අතර, ඉන් ඉල්ලීම් 137 ක් සම්බන්ධයෙන් අදාළ තොරතුරු සම්පූර්ණයෙන්ම හෝ කොටසක් ඍජුවම ඉල්ලුම්කරුවන් වෙත ලබා දීමට කටයුතු කරන ලද අතර, ඉල්ලීම් 01 ක් සම්බන්ධයෙන් අදාළ තොරතුරු ඒ ඒ අමාත්‍යාංශ වෙතින් ලබා ගැනීම සඳහා ඉල්ලුම්කරුවන් වෙත පහසුකම් සලසන ලදී. පනතේ විධිවිධාන යටතේ ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව 28 කි.

පනතේ විධිවිධාන අනුව, සෑම තොරතුරු ඉල්ලීමක් සම්බන්ධයෙන්ම දින තුනක් ඇතුළත තොරතුරු අයදුම්පත ලැබුන බව දන්වා යැවීමටත් හෝ අදාළ තොරතුරු ලබාදීමටත්, සංරක්ෂණය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුවේ තබා ඇති පැරණි ලේඛන එම දෙපාර්තමේන්තුව වෙතින් ආපසු ගෙන්වාගෙන ලබාදීමට ගත වූ කාලය හැරුණු විට අනෙක් සෑම ඉල්ලීමක් සම්බන්ධයෙන්ම නියමිත කාල වකවානුව තුළ ප්‍රතිචාර දැක්වීමටත් කටයුතු කරනු ලැබ ඇත.

තෙවන පාර්ශවයක් වෙත යොමු කරන ලද ඉල්ලීම් ද ඇතුළත්ව 2023 වර්ෂය තුළ ලැබුණු තොරතුරු ඉල්ලීම් පිළිබඳ කටයුතු කළ ආකාරය පහත සඳහන් පරිදි විය.

| | | |
|---|---|---|
| 5.1 | වසර පුරා ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 167 |
| 5.2 | තොරතුරු සම්පූර්ණයෙන්ම සැපයූ තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 132 |
| 5.3 | තොරතුරු කොටසක් පමණක් සැපයූ ඉල්ලීම්වල සංඛ්‍යාව | 04 |
| 5.4 | 2019-02-26 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණය අනුව අදාළ අමාත්‍යාංශය වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා පහසුකම් සලසන ලද ඉල්ලීම් සංඛ්‍යාව | 01 |
| 5.5 | පනතේ 5 වන වගන්තිය යටතේ ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 19 |
| 5.6 | පනතේ 3 වන වගන්තිය අනුව අදාළ තොරතුරු භාරයේ සන්තකයේ හෝ පාලනය යටතේ නොතිබීම මත ප්‍රතික්ෂේප කරන ලද තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 09 |
| 5.7 | තොරතුරු ඉල්ලීමකට ප්‍රතිචාර දැක්වීමට සාමාන්‍යයෙන් ගනු ලැබූ කාලය | දින 3-4 |
| 5.8 | තැපෑලෙන් ලැබුණු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 52 |
| 5.9 | විද්‍යුත් තැපෑලෙන් ලැබුණු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 100 |
| 5.10 | තැපෑලෙන් හෝ විද්‍යුත් තැපෑලෙන් නොවන ක්‍රම මඟින් ලැබුණු තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | 15 |

## 6. තොරතුරු ඉල්ලීම්වල ස්වභාවය - 2023

| | | | |
|---|---|---|---|
| 6.1 | තොරතුරු ඉල්ලීම් වැඩිම හා දෙවනියට වැඩිම ප්‍රමාණයක් ලැබී තිබෙන්නේ කුමන ස්වභාවයේ තොරතුරු ඉල්ලීම් සම්බන්ධයෙන්ද යන වග | | |
| | 6.1.1 | වැඩිම ප්‍රමාණයක් | ආයතන කටයුතු සම්බන්ධ අමාත්‍ය මණ්ඩල තීරණ |
| | 6.1.2 | දෙවනියට වැඩිම ප්‍රමාණයක් | විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති සම්බන්ධ අමාත්‍ය මණ්ඩල තීරණ |
| 6.2 | තොරතුරු ඉල්ලීම් වර්ගීකරණය | | සංඛ්‍යාව |
| | 6.2.1 | ප්‍රසම්පාදන කටයුතු | 02 |
| | 6.2.2 | ආයතන කටයුතු | 59 |
| | 6.2.3 | දේශපාලන පළිගැනීම් | 05 |
| | 6.2.4 | මූල්‍ය | 03 |
| | 6.2.5 | පරිසර සංරක්ෂණය | 03 |
| | 6.2.6 | විවිධ රාජ්‍ය ප්‍රතිපත්ති | 22 |
| | 6.2.7 | නීතිමය කරුණු | 07 |
| | 6.2.8 | වෙනත් විවිධ කරුණු | 66 |
| | එකතුව | | 167 |

## 7. තොරතුරු ඉල්ලා සිටින්නා පිළිබඳ පැතිකඩ - 2023

| | | | තොරතුරු ඉල්ලීම් සංඛ්‍යාව | සමස්තයෙන් % |
|---|---|---|---|---|
| 7.1 | තනි පුද්ගලයන් විසින් සිදු කරන ලද තොරතුරු ඉල්ලීම් ගණන | | 141 | 84% |
| 7.2 | සංවිධාන විසින් හෝ සංවිධාන නියෝජනය කරන ලද සිදු කරන ලද තොරතුරු ඉල්ලීම් ගණන | | 26 | 16% |
| 7.3 | **තොරතුරු ඉල්ලීම ඉදිරිපත් වූ පළාත් අනුව** | | | |
| | 7.3.1 | මධ්‍යම පළාත | 15 | 9% |
| | 7.3.2 | නැගෙනහිර පළාත | 04 | 2% |
| | 7.3.3 | උතුරු-මැදපළාත | 06 | 4% |
| | 7.3.4 | උතුරු පළාත | 01 | 1% |
| | 7.3.5 | වයඹපළාත | 05 | 3% |
| | 7.3.6 | සබරගමුව පළාත | 05 | 3% |
| | 7.3.7 | දකුණ පළාත | 11 | 7% |
| | 7.3.8 | ඌව පළාත | 04 | 2% |
| | 7.3.9 | බස්නාහිර පළාත | 108 | 65% |
| | 7.3.10 | පදිංචිය නිශ්චිතව සඳහන් නොවූ | 08 | 5% |
| | 7.3.10 | විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් | 0 | 0% |

**8.** තොරතුරු ලබාදීම ප්‍රතික්ෂේප කිරීම සම්බන්ධයෙන් කිසියම් තැනැත්තෙකු දඬුවමට / විනය ක්‍රියාමාර්ගයකට භාජනය කිරීමක් 2023 වර්ෂයේදී මෙම කාර්යාලයට අදාළව සිදු වී නොමැත.

## 9. අභියාචනා සහ කොමිෂන් සභාවේ මාර්ගෝපදේශ

ඉල්ලා ඇති තොරතුරු නිකුත් නොකිරීම හෝ නියමිත කාලරාමු අනුගමනය නොකිරීම සම්බන්ධයෙන් අභියාචනා 10 ක් නම් කළ නිලධාරි ලෙස අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා වෙත 2023 වර්ෂය තුළ ඉදිරිපත්ව තිබුණි. ඉන් එක් අභියාචනයක් අභියාචනකරු විසින් මුල් අවස්ථාවේදීම ඉවත් කර ගෙන ඇත.

සලකා බලන ලද ඉතිරි අභියාචනා 09 න් 05 ක් ම ඉදිරිපත්ව ඇත්තේ පනතේ 31(1)(ඇ) වගන්තිය යටතේ සම්පූර්ණ නොවූ, නොමඟ යවන සුළු හෝ සාවද්‍ය තොරතුරු ලබාදීම යන කරුණ මත පදනම්ව වන අතර, තවත් අභියාචනා 03 ක් සඳහා පදනම ලෙස දක්වා ඇත්තේ ඉල්ලා ඇති තොරතුරු නියමිත කාලරාමු තුළ නිකුත් කිරීමට අපොහොසත් වූ බවයි. කෙසේවෙතත් ඉතිරි අභියාචනය සඳහා නිශ්චිත හේතුවක් ඉදිරිපත් කර නොතිබුණි.

එම අභියාචනා 09 ම සම්බන්ධයෙන් නම් කළ නිලධාරි වශයෙන් අමාත්‍ය මණ්ඩලයේ ලේකම්වරයා විසින් ලබා දෙන ලද පිළිතුරු සහ ගන්නා ලද පියවර මගින් අභියාචකයින් සෑහීමකට පත් වී තිබිණි.

| **නම් කළ නිලධාරියා වෙත ඉදිරිපත් කළ අභියාචනා** | **සංඛ්‍යාව** |
|---|---|
| 9.1 නම් කළ නිලධාරියා වෙත ඉදිරිපත් කරන ලද අභියාචන | 09 |
| 9.2 නම් කළ නිලධාරියාගේ මග පෙන්වීම මත තොරතුරු ලබා දුන් හෝ අදාළ අමාත්‍යාංශ වෙතින් තොරතුරු ලබා ගැනීම සඳහා පහසුකම් සලසන ලද වාර ගණන | 09 |
| **තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ කොමිෂන් සභාව වෙත ඉදිරිපත් කළ අභියාචනා** | |
| 9.3 පොදු අධිකාරිය නොතීසි ලද සහ තොරතුරු ලබා නොදීම නිසා කොමිෂන් සභාවට පැමිණිලි ඉදිරිපත් වූ සම්පූර්ණ අභියාචනා ගණන | 00 |
| 9.4 තොරතුරු සපයන ලෙස කොමිෂන් සභාව විසින් නියෝග කරන ලද / මග පෙන්වීම් කරන ලද වාර ගණන | 00 |

## 10. තොරතුරු කළමනාකරණය හා වාර්තා පවත්වාගෙන යාම

### 10.1 තොරතුරු කළමනාකරණය සහ දත්ත ගබඩා පද්ධතිය පිළිබඳ විස්තර

අයදුම්කරුවන්ගෙන් එදිනෙදා ලැබෙන තොරතුරු අයදුම්පත්, ලිපි ලේඛන අංකගත කිරීමට ලියාපදිංචි ලේඛනයක් නඩත්තු කරන අතර, ඒ සෑම තොරතුරු ඉල්ලීමක්ම සාමාන්‍ය ගොනුගත කිරීම හා පරිගණකය භාවිතයෙන් ගොනුගත කර ඇත.

2006 වර්ෂයේ සිට මේ දක්වා වන අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාළ ලේඛන ඇතුළත් ගොනු අමාත්‍ය මණ්ඩල කාර්යාලය විසින් කළමනාකරණය කරනු ලැබේ. 2006 වර්ෂයට පෙර අමාත්‍ය මණ්ඩල තීරණ හා සංදේශ ඇතුළත් ගොනු ඒවා පරිශීලනය කිරීමේ අයිතිය රඳවා ගනිමින් සංරක්ෂණය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත භාර දෙනු ලැබ තිබේ.

1947 වර්ෂයේ සිට වර්තමානය දක්වා පවත්වන ලද අමාත්‍ය මණ්ඩල රැස්වීම්වල වාර්තා සුරක්ෂිතව ගබඩා කර පවත්වා ගෙන යනු ලැබේ. 1992 වර්ෂයේ සිට මේ දක්වා අමාත්‍ය මණ්ඩල තීරණ පහසුවෙන් සොයා ගැනීම සඳහා කාර්යාලය විසින්ම නිර්මාණය කරන ලද මෘදුකාංග දෙකක් භාවිත කරනු ලැබේ.

එදිනෙදා ලැබෙන අමාත්‍ය මණ්ඩල සංදේශ හා තීරණවල පරිලෝකනය කරන ලද (scanned) පිටපත් ගබඩා කිරීම 2019 වර්ෂයේ සිට ආරම්භ කරන ලදී.

තවද, පැරණි අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාළ ලේඛන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත ලබා දීමට පෙර පරිලෝකනය කරන ලද පිටපත් ලබාගැනීමටත්, ක්‍රමක්‍රමයෙන් 2005 සිට 2018 දක්වා අමාත්‍ය මණ්ඩල තීරණ හා අදාළ ලේඛන පරිලෝකනය කර විද්‍යුත් පිටපත් තබා ගැනීමටත් කටයුතු කෙරෙන අතර මෙමගින් එම පැරණි ලේඛන නිකුත් කිරීම කාර්යක්ෂමව සිදු කිරීමට අපේක්ෂා කෙරේ

### 10.2 වසර තුළ අදාළ පද්ධතිය යාවත්කාලීන කළේ ද? එසේ නම් ඒ පිළිබඳ විස්තර

යාවත්කාලීන කරන ලදී.

වර්ෂය තුළ ලැබුණු සියලු අමාත්‍ය මණ්ඩල පත්‍රිකා සහ ඒ පිළිබඳ ගනු ලැබූ අමාත්‍ය මණ්ඩල තීරණ අදාළ අමාත්‍ය මණ්ඩල රැස්වීම්වල වාර්තාද සහිතව ගොනු ගත කර ඇති අතර පහසු ප්‍රවේශය සඳහා පරිලෝඛනය කරන ලද විද්‍යුත් පිටපත් ද ගබඩා කර ඇත.

තොරතුරු ඉල්ලීම් වලට අදාළව සිදු කරන ලද සියලු සන්නිවේදන දෘඪ හා මෘදු ලේඛන යන ආකාර දෙකෙන්ම තොරතුරු පද්ධතිය තුළ යාවත්කාලීන කරනු ලැබ තිබේ.

**10.3 වාර්තා ගබඩා කර ඇති ආකාරය -**

දෘඪ ලේඛනමය ගොනු වශයෙන් සහ විද්‍යුත් දත්ත පද්ධතිය ඔස්සේ මෘදු පිටපත් වශයෙන්.

**10.4 වාර්තා යොමු සහිතව, සුචිගත කර පහසුවෙන් නැවත ලබාගත හැකි ලෙස ගබඩා කර තිබේ ද?**

ඔව්

**10.5 ඉහත යොමු සහ සුචිගත කිරීම්වලට වසර තුළ සිදුකරන ලද වැඩිදියුණු කිරීම් සහ වෙනස්කම්**

පවතින ඇතැම් පරිගණක මෘදුකාංග නව අංග සහිතව වැඩිදියුණු කිරීම හා යාවත් කාලීන කිරීම.

**10.6 ලේඛනාගාරයෙහි පවතින වාර්තාවක් සොයා ඉදිරිපත් කිරීමට අවශ්‍ය සාමාන්‍ය කාලය -**

විනාඩි 05ක් පමණ

**10.7 භෞතික දත්ත ගබඩා සම්බන්ධයෙන්, අදාළ වාර්තා ආයතනිකාව/ ආයතනයෙන් බැහැරව හෝ එම දෙයාකාරයටම ගබඩාකර ඇති ද?**

දෙයාකාරයටම ගබඩාකර ඇත.

ඉඩ පහසුකම් කළමනාකරණය කර ගැනීමේ අරමුණෙන් 2008 වර්ෂයට පෙර අමාත්‍ය මණ්ඩල තීරණවලට අදාළ ලේඛන සංරක්ෂණය සඳහා ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත යොමු කර ඇති අතර, විවිධ රාජ්‍ය ආයතනවල ඉල්ලීම් අනුව සහ තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත යටතේ ඉල්ලුම්කරුවන් පැරණි තොරතුරු ඉල්ලා සිටින අවස්ථා වලදී, එම ලේඛන ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙතින් නැවත

ගෙන්වා ගැනීමෙන් අනතුරුව ඉල්ලුම්කරු වෙත ලබාදීමට මෙම කාර්යාලය විසින් කටයුතු යොදා තිබේ.

ජාතික ලේඛනාරක්ෂක දෙපාර්තමේන්තුව වෙත සංරක්ෂණය පිණිස භාර දීමට පෙර ලේඛන පරිලෝකනය කිරීම මඟින් පැරණි අමාත්‍ය මණ්ඩල තීරණවලට අදාළ ලේඛන නිකුත් කිරීමේ ක්‍රියාවලිය කාර්යක්ෂම කිරීමට පියවර ගෙන ඇති අතර වරින් වර ගෙන්වා ගනු ලබන සංරක්ෂණය පිණිස දැනටමත් භාරදී ලේඛනද පරිලෝකනය කර ගබඩා කෙරේ.

**10.8 පවතින වාර්තා වසර 10 දක්වා සහ නව වාර්තා වසර 12ක් නඩත්තු කිරීමට අවශ්‍ය පහසුකම් සළසා තිබේ ද?**

ඔව්.

2008 වර්ෂය තෙක් පැරණි අමාත්‍ය මණ්ඩල තීරණ, සංදේශ සහ ඒ හා සබැඳි ලේඛන භෞතික හා විද්‍යුත් ගොනුගත කිරීම් මඟින් කඩිනමින් ලබාගත හැකි ආකාරයට අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ ගබඩා කර ඇති අතර නව වාර්තා හා ලේඛනද භෞතික හා විද්‍යුත් ක්‍රම මඟින් වසර 12 ඉක්මවා නඩත්තු කිරීමට අවශ්‍ය පියවර ගනු ලැබ තිබේ.

**10.9 තොරතුරු ගබඩාකරණය සහ කළමනාකරණය වෙනුවෙන් අයවැය ප්‍රතිපාදන වෙන්කර තිබේ ද?**

එම කාර්යය සඳහා විශේෂ ප්‍රතිපාදන වෙන් කර නොමැති නමුත් කාර්යාලය සඳහා වෙන් කර ඇති වාර්ෂික අය-වැය ප්‍රතිපාදන තුළ අවශ්‍ය වියදම් කළමනාකරණය කර ගනු ලැබේ.

**10.10 වාර්තා ඩිජිටල් මාධ්‍යයෙන් පවත්වාගෙන නොයයි නම් එම වාර්තා ඩිජිටල් මාධ්‍යයට හැරවීම උදෙසා වසර තුළදී ගනු ලැබූ හෝ යෝජිත ක්‍රියාමාර්ග කවරේ ද?**

අදාළ නොවේ.

**10.11 වාර්තා ඩිජිටල් මාධ්‍යයෙන් ගබඩා කර තිබේ නම් අදාළ කාර්යය පොදු අධිකාරිය විසින් හෝ බාහිර පාර්ශවයක් විසින් සිදුකළේ ද යන වග -**

මෙම කාර්යාලයේ කාර්ය මණ්ඩලය විසින් වර්තමානයේ එය සිදුකෙරේ.

**10.12** **ඩිජිටල් මාධ්‍යයෙන් පවතින දත්ත / වාර්තාවන්ට අන්තර්ජාලය ඔස්සේ පිවිසිය හැකිද ?**

ඩිජිටල් මාධ්‍යයෙන් පවතින ඇතැම් දත්ත හා වාර්තා පමණක් මෙම කාර්යාලයේ වෙබ් අඩවිය වන www.cabinetoffice.gov.lk හරහා පිවිසීම මගින් ලබාගත හැක.

**10.13** **එසේනම්, අවම වශයෙන් මසකට වරක් අන්තර්ජාල සුරක්ෂාව (Network Security) යාවත්කාලීන කරන්නේ ද?**

ඔව්

## 11. වාර්තා පවත්වාගෙනයාම හා කළමනාකරණය වැඩිදියුණු කිරීම හා ඒ සම්බන්ධයෙන් ඇති බාධක ඉවත් කිරීම සඳහා යෝජනා

රජයේ ආයතන අතර ලේඛන සන්නිවේදන කටයුතු හැකිතාක් විද්‍යුත් ක්‍රමවේද මගින් සිදු කිරීම මගින් වාර්තා පවත්වාගන යාම හා කළමනාකරණය වඩා කාර්යක්ෂමව හා ඵලදායීව සිදු කිරීමට හැකි වනු ඇත.

මෙම කාර්යාලයේ පරිචය අනුව, සරල මෘදුකාංග භාවිතය තොරතුරු හා වාර්තා පිරික්සීම පහසු කරන අතර, හැකි සෑම විටම ලේඛනවල පරිලෝකනය කරන ලද විද්‍යුත් පිටපත් තබා ගැනීම කාර්යාල ඉඩ පහසුකම් කළමනාකරණය කර ගැනීමටත්, තොරතුරු කඩිනමින් සොයා ගැනීමටත්, නිකුත් කිරීමටත් උපකාරී වේ.

## 12. තොරතුරු ලබාගැනීම සඳහා පුරවැසියන්ට ලබාදී ඇති පහසුකම්

තොරතුරු ලබාගැනීම සඳහා අපේක්ෂා කරනු ලබන පුරවැසියන්ට තම තොරතුරු ඉල්ලීමේ අයදුම්පත් මෙම කාර්යාලයට පැමිණ භාරදීමට, තැපෑලෙන් එවීමට, 011-2323730 අංකයට ෆැක්ස් කිරීම හෝ rti@cabinetoffice.gov.lk විද්‍යුත් තැපැල් ලිපිනය මගින් යොමුකිරීමටද, 011-2431011 මගින් තොරතුරු නිලධාරි අමතා අවශ්‍ය තොරතුරු විමසීම් කිරීමට ද පහසුකම් සලසා දී ඇත. ඒවාට පිළිතුරු ලබාදීම ද විද්‍යුත් තැපෑල, සාමාන්‍ය තැපෑල, ලියාපදිංචි තැපෑල මගින් හෝ පැමිණ භාර ගැනීමට ඉඩ සැලසීම යන ක්‍රම මගින් සිදු කරන ලදී.

තොරතුරු ලබාගැනීමට අමාත්‍ය මණ්ඩල කාර්යාලයට පැමිණෙන පුරවැසියන්ට තම තොරතුරු ඉල්ලීමේ අයදුම්පත් (RTI 01) භාරදීමට හා තොරතුරු ලබාගැනීම සඳහා මඟපෙන්වීමට මෙම කාර්යාලයේ ඉදිරිපස කවුන්ටරයෙහි සේවයෙහි යොදවන නිලධාරීන් පුහුණු කර තිබේ.

තොරතුරු ලබාගැනීමේ දී අනුගමනය කළ යුතු පියවර, ඒ සඳහා භාවිත කළ යුතු අයදුම්පත්, පනත ක්‍රියාත්මක කිරීම පිළිබඳ නිකුත් කර ඇති අති විශේෂ ගැසට් පත්‍ර යනාදී අවශ්‍ය සියලුම විස්තර පුරවැසියනට දැන ගැනීමේ පහසුව සඳහා භාෂාත්‍රයෙන් අපගේ නිල වෙබ් අඩවිය වන www.cabinetoffice.gov.lk හි පළ කර ඇත.

එසේම ඉල්ලුම් කරන ලද තොරතුරු ලබාදීම සඳහා හැකි සෑම අවස්ථාවකදීම අදාළ ලේඛන පරිලෝකනය (scan) කර විද්‍යුත් තැපැල මඟින් සෘජුවම හෝ අදාළ අමාත්‍යාංශ හරහා හෝ ලබාදීමට කටයුතු යොදා ඇත.

මෙයට අමතරව සියලුම අමාත්‍යවරුන්ගේ නාම ලේඛන සහ සම්බන්ධිත තොරතුරු මෙන්ම සියලුම අමාත්‍යාංශවල හා අමාත්‍යාංශ ලේකම්වරුන්ගේ සම්බන්ධිත තොරතුරුද යාවත්කාලීන කරමින් අමාත්‍ය මණ්ඩල කාර්යාලයේ නිල වෙබ් අඩවිය වන www.cabinetoffice.gov.lk හි පළ කිරීමට කටයුතු කර ඇත.

තවද, අමාත්‍ය මණ්ඩලය වෙත සංදේශ/සටහන් ඉදිරිපත් කිරීම පිළිබඳ මාර්ගෝපදේශ මහජනතාවගේ දැන ගැනීම සඳහා කාර්යාලයේ නිල වෙබ් අඩවියේ භාෂාත්‍රයෙන් සටහන් පළ කරනු ලැබ ඇත. සතිපතා පවත්වනු ලබන අමාත්‍ය මණ්ඩලය රැස්වීම්වලදී ගනු ලබන ප්‍රවෘත්තිමය වටිනාකමක් සහිත තීරණ මහජනතාව වෙත දැනුම් දීමේ මාධ්‍ය වර්තාවද කාර්යාලයේ නිල වෙබ් අඩවියේ භාෂාත්‍රයෙන් පළ කරනු ලැබේ.

## 13. තොරතුරු ලබා දීම සඳහා 2023 වර්ෂය තුළ අයකරන ලද ගාස්තු

2023 වර්ෂය තුළ මෙම කාර්යාලය විසින් සෘජුවම නිකුත් කරන ලද තොරතුරු පිටු හතරකට වඩා වැඩි අවස්ථාවල මුද්‍රිත ලේඛන වෙනුවෙන් ගාස්තු වශයෙන් රු.2,196.00 ක මුදලක් එක් රැස් කරනු ලැබ තිබේ.


## 14. තොරතුරු පනතේ ක්‍රියාකාරිත්වය හා විනිවිදභාවය ප්‍රවර්ධනය කිරීම උදෙසා වන යෝජනා

- ප්‍රගාමී තොරතුරු හෙළිදරව් කිරීම වඩාත් බලපෑම්සහගත කරවීමේ අරමුණින් රාජ්‍ය ආයතන සිය වෙබ් අඩවි වලට අමතරව නිල සමාජ මාධ්‍ය ගිණුම් භාවිත කිරීම දිරිමත් කිරීම උචිත වනු ඇත. මහජන ජීවිතයට වඩාත් බලපෑම් සහගත සේවාවන් සපයනු ලබන ආයතන සඳහා මෙය අනිවාර්ය කිරීම සුදුසුය.

- තොරතුරු දැන ගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනතේ විධිවිධාන හා අනුකූල වන පරිදි ආයතන සංග්‍රහය සහ ප්‍රසම්පාදන මාර්ගෝපදේශ සංශෝධනය කිරීම මඟින් එකී පනතේ විධිවිධාන බලාත්මක කිරීමේදී දැනට පවතින ප්‍රායෝගික දුර්වලතා මඟහැරිය හැකි වනු ඇත.

- කඩදාසි මිල සහ තැපැල් ගාස්තු ඉහල යාම සැලකිල්ලට ගෙන තොරතුරු ඉල්ලුම් කිරීමේදී හා නිකුත් කිරීමේදී රජයට දැරීමට සිදුවන වැය බර වැඩිවීම සැලකිල්ලට ගෙන හැකි සෑම විටම විද්‍යුත් තැපැල් මඟින් තොරතුරු ඉල්ලීම් ඉදිරිපත් කිරීමට පුරවැසියන් දිරි ගැන්වීම උචිත වනු ඇත.

- 2022 අංක 09 දරන පෞද්ගලික දත්ත ආරක්ෂණ පනතේ ප්‍රතිපාදන 2016 අංක 12 දරන තොරතුරු දැනගැනීමේ අයිතිවාසිකම පිළිබඳ පනත ක්‍රියාත්මක කිරීමේ දී බලපාන අන්දම පිළිබඳ තොරතුරු නිලධාරීන් දැනුම්වත් කිරීමද සුදුසුය.

අත්සන : 

නම : **ඩබ්ලිව්. එම්. ඩී. ජේ. ප්‍රනාන්දු**

තනතුර : **අමාත්‍ය මණ්ඩලයේ ලේකම් / නම් කළ නිලධාරි**

දිනය : **2024-12-** 21